Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ඇබෑර්තු

### උද්‍යාන නඩත්තු සහායක තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ "උද්‍යාන නඩත්තු සහායක තනතුර" සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් **2021 අගෝස්තු මස 06** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "උද්‍යාන නඩත්තු සහායක තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.Parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය.)

1. **වැටුප් පරිමාණය :** 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520 - 9 x 270/10 x 300/6 x 330 - 32,930 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 57,000 පමණ වේ.)

2. **වයස් සීමාව :** අයදුම්පත් භාර ගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. **අධ්‍යාපන සුදුසුකම් වෘත්තීයය සුදුසුකම් සහ පළපුරුද්ද :**

(අ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

උද්‍යාන නඩත්තු ක්ෂේත්‍රයේ හෝ තවාන් කළමනාකරණ ක්ෂේත්‍රයේ NVQ Level 2 සහතිකය ලබා තිබීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව උද්‍යානකරණය/උද්‍යාන නඩත්තුව/තවාන් කළමනාකරණය යන ක්ෂේත්‍රවල මාස හයකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීනේ අනතුරුව රජයේ උද්භිද උද්‍යානයක උද්‍යානකරණය/උද්‍යාන නඩත්තුව/තවාන් කළමනාකරණය යන ක්ෂේත්‍රවල අවුරුදු පහකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

4. **බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5. **සේවා නියමයන් හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය.
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

7. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2021 ජූලි මස 16 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම්පත්‍රය

**උද්‍යාන නඩත්තු සහායක තනතුර**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................................
..........................................................................................
..........................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..........................................................................................
..........................................................................................
..........................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (*Mr/Mrs/Miss*) ..........................................................................................
..........................................................................................
..........................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

03. (අ) පෞද්ගලික ලිපිනය : ..............................................................................................
..............................................................................................
..............................................................................................

දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ආ) කාර්යාලයීය ලිපිනය : ..............................................................................................
..............................................................................................
..............................................................................................

දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය)

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

05. විවාහක/අවිවාහක බව : (විවාහක/අවිවාහක)

06. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී/පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| *විභාගය* | *විෂයය* | *සාමාර්ථයන්* | *සමත්වූ වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස. (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතු ය)
..............................................................................................
..............................................................................................
..............................................................................................

10. පළපුරුද්ද : (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

.......................................................................................................................................................................................

.......................................................................................................................................................................................

.......................................................................................................................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :

(අ) ආයතනයේ නම හා ලිපිනය : ..........................................................................................................................

(ආ) මුල් පත්වීමේ දිනය : ..................................................................................................................................

(ඇ) දැනට දරන තනතුර : ...................................................................................................................................

(ඈ) මාසික මූලික වැටුප : ..................................................................................................................................

(ඉ) දීමනා : .........................................................................................................................................................

(ඊ) දළ වැටුප : .....................................................................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :

.......................................................................................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද ? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.

.......................................................................................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

.

..........................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .....................................

---

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

**(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ........................................................................................................................ තනතුර දරන, ...................... ............................................................. මයා/මිය මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

.

.........................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය : ....................................